# සංකල්ප සටහන CONCEPT NOTE

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය[UNESCO]**

## *'තොරතුරු හා මූලික නිදහසවල් වෙත ප්‍රවේශය,*

## *මෙය ඔබගේ අයිතිය යි! '*

***ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය - 2016 මැයි 3***

**හැඳින්වීම**

සෑම මැයි 3 වන දා ම පෘථිවි ගෝලය පුරා ම ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය සමරනු ලැබේ. එය වනාහි මාධ්‍ය නිදහස පිළිබඳ මූලික මූලධර්ම පෙරට ගැනීම සඳහාත් රාජකාරිය අතරතුර දී සිය ජීවිත අහිමි වූ මාධ්‍යවේදීන්ට විධිමත් ලෙස බුහුමන් දැක්වීම සඳහාත් ලැබෙන්නා වූ අවස්ථාවකි. 2016 දී ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය වැදගත් සන්ධිස්ථාන තුනක් සමග සම්පාත වෙයි:

- නූතන ස්වීඩනය හා පින්ලන්තය ආවරණය කරමින් තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ ලොව පළමු නීතිය සම්මත කිරීමේ 250 වන සංවත්සරය
- මාධ්‍ය නිදහසට අදාළ මූලධර්ම පිළිබඳ වින්ඩ්හෝක් ප්‍රකාශනය සම්මත කිරීමේ 25 වන සංවත්සරය
- 2016 වසර නව තිරසර සංවර්ධන පරමාර්ථවල 15 වසරක ජීවන චක්‍රයේ පළමු වසර ද වේ

2016 ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය ඩිජිටල් යුගයේ දී මාධ්‍ය නිදහස ද විවෘත භාවයේ සංස්කෘතිය ද තොරතුරු දැන ගැනීමේ නිදහස සඳහා ඇති අයිතිය ද තිරසර සංවර්ධනය ද අතර පවත්නා සම්බන්ධතා අවධාරණය කරන්නේ මෙම පසුබිම තුළ ය. මේ සියල්ල එකට බැඳ තබන හුයපට නම් මාධ්‍යවේදය ඉටු කරන කාර්ය භාරය ද මහජනතාව උදෙසා එකී සේවය ඉටු කරන්නන් ආරක්ෂා කිරීමේ වැදගත්කම ද වන්නේ ය.

මේ වසරේ ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය එකිනෙකට වෙනස් දැක්මවල් තුනක් පදනම් කර ගෙන ප්‍රශ්න විමසා බලනු ඇත:

- තොරතුරු දැන ගැනීමේ නිදහස මූලික නිදහසක් සහ මානව හිමිකමක් ලෙස සැලකීම,
- පමණ ඉක්මවූ වාරණයෙන් හා සමීප නිරීක්ෂණයෙන් මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම; සහ
- ඔන්ලයින් හා ඕෆ්ලයින් මාධ්‍යවේදයේ සුරක්ෂිතතාව සහතික කිරීම.

**පසුබිම**

ස්වීඩනය-පින්ලන්තය තුළ තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ ලොව පළමු නීතිය සම්මත කිරීම වූකලි ඓතිහාසික සන්ධිස්ථානයකි. එම නීතිය ගෝලීය පරිමාණව ප්‍රතිඵල අත් කර දී තිබෙන අන්තර් සම්බන්ධිත මිනුම් දඬු දෙකක් නීතිමය වශයෙන් පිළිගත්තේ ය: එනම්, (i) පුරවැසියන්ට රාජ්‍යයේ මැදිහත් වීමකින් තොරව තම අදහස් පළ කිරීමට අයිතිය තිබිය යුතු ය යන්න සහ, විශේෂයෙන් ම වැදගත් කරුණ වන (ii) පුරවැසියන්ට රාජ්‍යය සන්තක තොරතුරු ලබා ගැනීමට අවස්ථාව තිබිය යුතු ය යන්න යි. මෙම දැක්මෙන් කියැවෙන්නේ රාජ්‍යය පුරවැසියන්ගේ තොරතුරු ක්ෂේත්‍රය සීමා කිරීම හෝ ඔවුන්ගෙන් තොරතුරු වසන් කිරීම නො කළ යුතු බව යි. මෙය වනාහි

එක් අතකින් ප්‍රසිද්ධ සංවාදයට රාජ්‍යය කරන අත්තනෝමතික මැදිහත් වීමට සීමාවක් පනවන්නා වූ ද අනෙක් අතින් වග වීම සඳහා රාජ්‍ය බලයට ඇති වගකීම තව දුරටත් ශක්තිමත් කරන්නා වූ ද ආස්ථානයකි.[1] කෙටියෙන් කිව හොත්, එය රාජ්‍ය වාරණයෙන් තොරව තොරතුරු පැතිරවීමට සමාජය නිදහස් කරන අතර තව දුර ඉදිරියට ගොස් රාජ්‍යය සමාජයේ සුපරීක්ෂාවට ද විවර කොට තබයි.

1991 වසරේ නැමීබියාවේ දී පුවත්පත් කලාවේදීන් වින්ඩ්හෝක් ප්‍රකාශනය (Windhoek Declaration) පිළිගැනීම එක්සත් ජාතීන් ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය (World Press Freedom Day – WPFD) පිළිගැනීමට තුඩු දුන්නේ ය. මෙම ප්‍රකාශනය පුවත්පත් නිදහස සමන්විත වන්නේ මාධ්‍ය නිදහසෙන්, බහුත්වවාදයෙන් හා ස්වාධීනත්වයෙන් බව අවධාරණය කළේ ය. සෑම වසරක දී ම මෙම දිනය ලොව වටා පාර්ශ්වකරුවන්ට මෙම අයිතිය සැමරීම හා ශක්තිමත් කිරීම සඳහා අවස්ථාවක් බවට පත් වේ.

එපමණක් නො ව, 2016 වසර 2015 දී සම්මත කර ගන්නා ලද අභිලාෂාත්මක නව තිරසර සංවර්ධන පරමාර්ථවල (Sustainable Development Goals – SDGs) 15 වසරක ජීවන චක්‍රයේ පළමු වසර ද වන්නේ ය. මාධ්‍ය නිදහස හා තොරතුරු සඳහා ඇති අයිතිය එම පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ඍජුව ම අදාළ වන අතර එම පරමාර්ථ යටතේ මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂිත වක්‍ර පරමාර්ථ ලෙස ද සැලකිය හැකි ය. තිරසර සංවර්ධන පරමාර්ථ එළඹෙන වසරවල දී බොහෝ ප්‍රතිපත්තිමය තීන්දු න්‍යාය පත්‍රයට ඇතුළු කරනු ඇත, සම්පත් සජීවීකරණය හා ගලා යාම කෙරෙහි බලපෑම් කරනු ඇත, සෑම පුද්ගලයෙකුගේ ම ජීවිත වැඩි දියුණු කරන දීර්ඝ කාලීන ක්‍රියාවලියක් තුළ දී මනුෂ්‍ය වර්ගයාගේ පොදු අවශ්‍යතා ඉස්මතු කර දක්වනු ඇත.

**විශ්ලේෂණය**

වෘත්තීය ප්‍රමිතීන් හා පොදු යහපත සිය මාර්ගෝපදේශකයා බවට පත් කර ගනිමින් අදහස් පළ කිරීමේ නිදහස සඳහා ඇති අයිතිය පාවිච්චි කරන විශේෂඥ ක්ෂේත්‍රයක් ලෙස මාධ්‍යවේදය ඉටු කරන කාර්ය භාරය හරහා මාධ්‍ය නිදහස ද තොරතුරු සඳහා ඇති අයිතිය ද තිරසර සංවර්ධනය ද යන මෙම අංග තුන එකිනෙකට සම්බන්ධ වේ. නිර්මාණාත්මක සංස්කෘතික අදහස් පළ කිරීම්වල විවිධත්වය ද මෙම සමීකරණයේ වැදගත් සාධකයක් වේ.

මෙම තක්සේරුව ඇරඹෙන්නේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ (Universal Declaration of Human Rights) 19 වන වගන්තියෙනි.[2] අදහස් පළ කිරීමේ නිදහස නමැති මූලික අයිතිවාසිකම තුළ " ඕනෑ ම මාධ්‍යයක් හරහා සහ දේශ සීමාවන් නො තකා තොරතුරු හා අදහස් සොයා යාමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ" නිදහස අඩංගු වන බව එය ප්‍රකාශ කරයි. *සොයා යාමේ හා ලබා ගැනීමේ* අයිතිය නැති විට තොරතුරු *බෙදා හැරීමේ* අයිතියෙහි තිබෙන්නේ සුළු වැදගත්කමක් පමණක් බව ද දෙවනුව කී ක්‍රියාකාරකමේ (යැවීමේ හා ලබා ගැනීමේ) පරිමාණය බෙදා හැරෙන දෙයෙහි පරිමාණය මත ඍජුව ම තීරණය වන බව ද මින් පැහැදිලි ය. වෙනත් වචනවලින් කිව හොත්, අදහස් පළ කිරීමේ නිදහස සඳහා ඇති අයිතිය නමැති කාසියෙහි දෙපැත්තක් ඇත: එනම්, පණිවුඩ නිපදවීම හා ඒවා පරිභෝජනය කිරීම යි. එකක් නොමැති විට මේ දෙකෙන් එකක වත් ප්‍රයෝජනයක් නැත.

මෙම අන්තර් සම්බන්ධතාවෙන් අදහස් වන්නේ සන්නිවේදනයේ බෙදා හැරීමේ පැතිකඩ මත යම් සීමාවක් පැනවුව හොත් ලබා ගැනීමේ පැතිකඩ කෙරෙහි ද ලබා ගැනීම මත යම් සීමාවක් පැනවුව හොත් බෙදා හැරීම කෙරෙහි ද බලපාන බව යි. එම නිසා, යම් සමාජයක් සතු තොරතුරු පරිසරය කොතරම් පොහොසත් ද විවෘත ද යන්න යට කී පැති දෙකේ නිදහස සඳහා පවතින ඉඩකඩ මත

[1] ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය අනුව "අත්තනෝමතික" යනුවෙන් හැඳින්වෙන්නේ නීතිමය පදනමකින් තොර වූ හෝ මුදුන් පමුණුවා ගැනීමට බලාපොරොත්තු වන අභිමතාර්ථයට අත්‍යවශ්‍ය නොවූ සහ/හෝ විසමානුපාතික වූ ක්‍රියාවන් සහ/හෝ එම අභිමතාර්ථය මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය තුළ විදහා දක්වා ඇති යුක්ති සහගත අභිමතාර්ථයන්ගෙන් එකක් නොවූ අවස්ථාවන් ය.
[2] 1948 දෙසැම්බර් 10 දා එක්සත් ජාතීන් විසින් සම්මත කරන ලදි.

රඳා පවතී. අනෙක් අතට එම ඉඩකඩ: (i) *මාධ්‍ය නිදහසේ* තත්ත්වය (එනම්, සංස්කෘතික අදහස් පළ කිරීම් ඇතුළු තොරතුරු ප්‍රසිද්ධ කිරීමට ඇති අයිතිය[3]) මත ද (ii) *තොරතුරු සඳහා ඇති අයිතිය* (එනම්, බලය පාවිච්චි කිරීම සම්බන්ධ විනිවිද භාවයේ තත්ත්වය) මත ද රඳා පවතී. මාධ්‍යවේදය මේ පැති දෙක ම සමග නොවෙන් කළ හැකි සේ බැඳී ඇත.

මේ පැති දෙකේ දී ම අදහස් පළ කිරීමේ නිදහස අනෙක් අයිතීන් සඳහා බෙහෙවින් වැදගත් වන අයිතියකි.[4] එය තිරසර සංවර්ධනය සඳහා ද බෙහෙවින් වැදගත් වේ. තිරසර සංවර්ධන පරමාර්ථවල දී "තොරතුරු හා මූලික නිදහසවල් වෙත පොදු ප්‍රවේශය" තිරසර සංවර්ධනයට ඇතුළත් බව පිළිගන්නේ මේ නිසයි. තිරසර සංවර්ධන පරමාර්ථවල ඉලක්කයක් ලෙස ගත් විට මේ අරමුණු වනාහි, "තිරසර සංවර්ධනය උදෙසා සාමකාමී හා සියල්ලන් ඇතුළත් කර ගත් සමාජයන් ප්‍රවර්ධනය කිරීම, යුක්තිය වෙත සියල්ලන්ට ප්‍රවේශය සම්පාදනය කිරීම සහ සියලු මට්ටම්වල දී කාර්ය සාධක, වග වන හා සියල්ලන් ඇතුළත් කර ගත් ආයතන ගොඩ නැගීම" යන වඩා පුළුල් පරමාර්ථයේ (අංක 16) උපකොටසකි. තොරතුරු හා මූලික නිදහසවල් වෙත පොදු ප්‍රවේශය යන දෙය හුදෙක් එය මුදුන් පමුණුවා ගැනීමෙන් ම අවසන් නොවන බව ද සමස්තයක් ලෙස 16 වන පරමාර්ථය මෙන් ම ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය සමානතාව හා දේශගුණික විපර්යාසයට විසඳුම් සෙවීම වැනි ඉතිරි තිරසර සංවර්ධන පරමාර්ථ ද සපුරා ගැනීමේ වැදගත් පියවරක් බව ද මේ අනුව පැහැදිලි ය.

16.10 ඉලක්කය මුදුන් පමුණුවා ගැනීමෙහි ලා අත් කර ගෙන තිබෙන ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යුනෙස්කෝව (UNESCO) මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UN Office of the High Commissioner for Human Rights) සහ ගෝලීය මාධ්‍ය සංවර්ධන සංසදය (Global Forum for Media Development) සමග එක්ව දර්ශක දෙකක් යෝජනා කළේ මේ නිසා යː

1. *මාධ්‍යවේදීන්, සහායක මාධ්‍ය කාර්ය මාණ්ඩලිකයන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා මානව හිමිකම් අභිදේශකයන් ඝාතනය කිරීම, පැහැර ගෙන යාම, බලාත්කාරයෙන් අතුරුදන් කිරීම, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම හා වධහිංසාවට ලක් කිරීම පිළිබඳව වාර්තා වී සත්‍යාසත්‍යතාව තහවුරු කර ගන්නා ලද සිදුවීම් සංඛ්‍යාව (පසු ගිය මාස 12 තුළ දී)*

2. *තොරතුරු වෙත පොදු ප්‍රවේශය උදෙසා ව්‍යවස්ථානුකූල, නීතිප්‍රකාර සහ/හෝ ප්‍රතිපත්තිමය සහතික වීම් පැවතීම හා ක්‍රියාත්මක කිරීම*

පළමු දර්ශකය මූලික නිදහසවල් පිළිබඳ තීරණාත්මක පියවරක් කෙරෙහි ඍජුව ම අවධානය යොමු කරන අතර එය මාධ්‍යවේදීන් ගැන කරන සඳහන තිරසර සංවර්ධනයේ මාධ්‍ය නිදහස පිළිබඳ පැතිකඩට ඍජුව ම සම්බන්ධ ය. දෙවන දර්ශකය තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ ප්‍රතිපත්ති හා ඒවා යොදා ගැනීම ද තිරසර සංවර්ධනයට ඒවායේ ඇති අදාළත්වය ද අවධාරණය කරයි.

මෙම දර්ශක අන්තර් සම්බන්ධිත ය. මාධ්‍ය නිදහස සහ ඒ හා බැඳි කරුණක් වන මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පොදු ජනතාවට ප්‍රවේශය තිබෙන තොරතුරු පරිසරය කෙරෙහි ඍජුව ම බලපායි. අනෙක් අතට, තොරතුරු වෙත පොදු ජනතාවට පවත්නා ප්‍රවේශය වඩා යහපත් වන තරමට මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව ඇතුළු මූලික නිදහසවලට ගරු කිරීම සඳහා වූ වාතාවරණය මෙන් ම නිර්මාණාත්මක සංස්කෘතික අදහස් පළ කිරීම සඳහා වූ වාතාවරණය ද වඩා යහපත් වේ.

---

[3] මෙම අයිතිය වැඩිපුර ම පාවිච්චි වන්නේ මාධ්‍යවේදීන් අතර වුවත් මාධ්‍ය නිදහස යනු ප්‍රවෘත්ති මාධ්‍යයට පමණක් සීමා වූවක් නො වේ. සමාජ මාධ්‍යය ද ඇතුළු ජන සන්නිවේදන වේදිකා යොදා ගනිමින් නිර්මාණාත්මක අන්තර්ගතය ඇතුළු අන්තර්ගතය වඩා පුළුල් ජනතාවක් අතර බෙදා හැරීම පිණිස අදහස් පළ කිරීමේ නිදහස සඳහා ඇති අයිතිය පාවිච්චි කිරීමට ඕනෑ ම පුද්ගලයෙකුට නිදහස ඇත. මේ අර්ථයෙන් ගත් විට මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් සෑම පුද්ගලයෙකුට ම ඍජු හිමිකමක් ඇති බව කිව හැකි ය. එම නිසා, සන්නිවේදකයන් අත්තනෝමතික සීමා පැනවීම්වලට ද සිය මාධ්‍ය කටයුතු නිසා ප්‍රහාරයට ලක් වීම යනාදි වශයෙන් මාධ්‍ය නිදහස සඳහා තමන්ට ඇති අයිතිය උල්ලංඝනය කරනු ලැබීම්වලට ද මුහුණ දෙන අවස්ථාවල දී සමාජය ඔවුන්ගේ රැකවරණය සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. එවිට විශේෂයෙන් ම පොදු යහපතට අදාළ තොරතුරු යටපත් නො වේ. එවැනි යටපත් වීමක් සිදු වුව හොත් තොරතුරු සොයා යාමේ හා ලබා ගැනීමේ හැකියාව සඳහා මහජනයාට ඇති අයිතියට වළ කැපී යා හැකි ය.

[4] මෙම වැටහීම 1946 තරම් ඈත දී පිළිගන්නා ලදි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (එකල ව්‍යවහාර වූ භාෂාව යොදා ගනිමින්) 59(1) යෝජනාව හරහා පවසා සිටියේ තොරතුරු දැන ගැනීමේ නිදහස (අද නම් "අදහස් පළ කිරීමේ නිදහස") යනු "මූලික මානව හිමිකමක් සහ ... එක්සත් ජාතීන් කැප වී සිටින සියලු නිදහසවල උරගල" බව යි.

පැන නැගෙමින් පවත්නා ඩිජිටල් යුගය මෙම දැක්මවල් වඩා පුළුල් කරයි. තිරසර සංවර්ධනය සඳහා තොරතුරු වඩ වඩා අත්‍යවශ්‍ය වන තරමට තොරතුරු සඳහා ඇති අයිතිය, මාධ්‍ය නිදහස සුරක්ෂිත කිරීම සහ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහතික කිරීම ද වඩ වඩා වැදගත් වන්නේ ය. සමස්තයක් ලෙස මනුෂ්‍ය වර්ගයා ම 2030 සංවර්ධන න්‍යාය පත්‍රය කරා පෙරට යාමට නම් සෑම පැතිකඩක දී ම ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය අසමානතා කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

මේ වසරේ ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනයේ අවධානය යොමු වන්නේ මෙම ගැටලු වඩා ගැඹුරින් විමසා බැලීම කෙරෙහි ය. එය එකිනෙකට වෙනස් දැක්මවල් තුනක් පදනම් කර ගෙන ප්‍රශ්න විමසා බලනු ඇතː එනම්, 1) තොරතුරු දැන ගැනීමේ නිදහස මූලික නිදහසක් සහ මානව හිමිකමක් ලෙස සැලකීම, 2) සිදු විය හැකි පමණ ඉක්මවූ වාරණයෙන් හා සමීප නිරීක්ෂණයෙන් මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම, සහ 3) ඔන්ලයින් හා ඕෆ්ලයින් මාධ්‍යවේදයේ සුරක්ෂිතතාව සහතික කිරීම යි.

**1) තොරතුරු දැන ගැනීමේ නිදහස මූලික නිදහසක් සහ මානව හිමිකමක් ලෙස සැලකීම**

තොරතුරු දැන ගැනීමේ නිදහස යනු රජයේ ආයතන සන්තක තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ඇති අයිතිය යැයි පොදුවේ නිර්වචනය කළ හැකි ය. *Freedom of Connection, Freedom of Expression* (සම්බන්ධ වීමේ නිදහස, අදහස් පළ කිරීමේ නිදහස) (2011) නමැති යුනෙස්කෝ ප්‍රකාශනය මෙසේ පැහැදිලි කරයිː "අදහස් පළ කිරීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිවලට ආධාරක වන්නා වූ මූලික සිවිල් අයිතිවාසිකම්වලින් එකක් යැයි සැලකෙන තාක් දුරට, පුරවැසියන්ට දැනුවත්ව ඡන්දය ප්‍රකාශ කළ හැකි බව සහ ඔවුන්ට මහජන සුපරීක්ෂාව හරහා ආණ්ඩුව වග වන තත්ත්වයට පත් කළ හැකි බව සහතික කිරීමට තොරතුරු දැන ගැනීමේ නිදහස අවශ්‍ය වේ." එපමණක් නො වේ. සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ (International Covenant on Civil and Political Rights – ICCPR) 19 වගන්තිය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව (UN Human Rights Committee) කළ 34 වන පොදු ප්‍රකාශයේ දී (General Comment 34) අපක්ෂපාතී අදහස් පළ කිරීම හා තොරතුරු වෙත ප්‍රවේශය අතර පවත්නා සම්බන්ධතා පුරවැසියන්ට රාජ්‍ය කටයුතුවලට සහභාගී වීමට පවත්නා අයිතිය සමග ප්‍රබල ලෙස සම්බන්ධ කරයි. මාධ්‍යවේදයට මේ සම්බන්ධයෙන් ඉටු කිරීමට විශාල කාර්ය භාරයක් ඇත.

යුනෙස්කෝවේ සාමාජික රාජ්‍යයන් විසින් බලය පවරන ලදුව 2015 දී යුනෙස්කෝව *Keystones to foster inclusive Knowledge Societies: Access to information and knowledge, Freedom of Expression, Privacy, and Ethics on a Global Internet* (සියල්ලන් ඇතුළත් කර ගත් දැනුම් සමාජයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ප්‍රධාන මූලධර්මː තොරතුරු හා දැනුම වෙත ප්‍රවේශය, අදහස් පළ කිරීමේ නිදහස, පෞද්ගලිකත්වය සහ ගෝලීය අන්තර්ජාලයක ආචාර ධර්ම) නමින් අධ්‍යයනයක් සිදු කළේ ය. එම අධ්‍යයනය අවධාරණය කර ඇත්තේ තොරතුරු සඳහා ඇති අයිතිය සමාජය තුළ වඩා පුළුල් විනිවිද භාවයක් පැවතීම සමග සම්බන්ධ බව යි. එය මාධ්‍යය හා තොරතුරු සාක්ෂරතාව යනාදිය හරහා පරිහරණය කරන්නන් තොරතුරු හා සන්නිවේදනය සමග කටයුතු කිරීමට බල ගැන්වීමේ වැදගත්කම ද අවධාරණය කරයි. නැවතත් මේ සියලු පැතිකඩවල් සඳහා ප්‍රධාන වන්නේ මාධ්‍යවේදය යි.

තොරතුරු වෙත ප්‍රවේශය විවෘත කිරීමට පවත්නා විශාල ම බාධාව වන්නේ ආණ්ඩුවේ පමණ ඉක්මවූ රහසිගත භාවය යි. රාජ්‍යයන්ට ජාත්‍යන්තර මානව හිමිකම් නීතිවල විදහා දක්වා ඇති නීත්‍යානුකූල අභිමතාර්ථයන්ට හා ක්‍රියාවලිවලට අනුකූලව සමහර තොරතුරු රහසිගතව තබා ගැනීමට හැකි විය යුතු ය. කෙසේ වුව ද, පරිපාලනයට හා විධායකයට අයත් බලධාරී ආයතනවල තොරතුරු වෙත - උදාහරණයක් ලෙස නීති හා රාජ්‍ය වියදම් වෙත - සියලු දෙනාට ම පොදුවේ ප්‍රවේශ විය හැකි විය යුතු ය. මේ අනුව ගත් විට, තොරතුරු දැන ගැනීමේ නිදහස ආණ්ඩුවේ ආයතන අධීක්ෂණය කිරීම සඳහා මෙන් ම එම ආයතන වග වීමට බැඳ තැබීම සඳහා ද ඉඩ සලසා ගැනීමට උදව් වන අතර මෙම අයිතිය මාධ්‍ය නිදහසේ සහ ස්වාධීන මාධ්‍යවේදයේ අදාළත්වය තව දුරටත් ශක්තිමත් කරයි.

1766 දී නූතන ස්වීඩනය හා පින්ලන්තය තුළ තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ ලොව පළමු නීතිය සම්මත කළ තැන් සිට තවත් රටවල් 90කට වැඩි ගණනක් එවැනි විධිවිධාන සම්මත කර ගෙන ඇත. කෙසේ වුව ද, බැහැර කිරීම් යොදා ගන්නේ පටු අර්ථයෙන් ද අයථා ක්‍රියා රහසේ දැනුම් දෙන්නන්ට ආරක්ෂණය සලසන්නේ ද පෞද්ගලික ආයතන සන්තකයෙහි පවත්නා අදාළ තොරතුරුවලට බලපාන්නේ ද යනාදි ගැටලු පවතී. තොරතුරු දැන ගැනීමේ නිදහස ක්‍රියාත්මක කිරීම ද ගැටලු මතු කරයි. නීති ප්‍රසිද්ධ කොට ඒ පිළිබඳව ජනතාව මැනවින් දැනුවත් කරන්නේ ද ජනතාව කරන ඉල්ලීම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරන්නේ ද ඉල්ලුම්කරු විශාල ගාස්තුවක් ගෙවිය යුතු ද තොරතුරු ප්‍රසිද්ධ කරන්නේ ආයතන විසින් ම තීරණය කොට ද නැත් නම් ඉල්ලීමක් කළ විට නිකුත් කරන්නේ ද යනාදිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.[5] තවත් ගැටලුවක් වන්නේ තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ නීති හෝ නීතිමය විධිවිධාන පවත්නා රටවල දී පවා මාධ්‍යවේදීන් අමු දත්ත (raw data) හෝ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී ද ඒවා තේරුම් ගැනීමේ දී ද අනතුරුව ඒවා යොදා ගැනීමේ දී ද දුෂ්කරතාවන්ට මුහුණ දීමට ඉඩ තිබීම යි. මෙය වූකලි පාඨකයන්, ශ්‍රාවකයන් හෝ ප්‍රේක්ෂකයන් "අදාළ ප්‍රවෘත්තිය පිළිබඳ නැවුම් තොරතුරකින්" දැනුවත් වන ප්‍රතිඵල ජනනය කිරීමට දත්ත වෙත ප්‍රවේශ වීමේ දී හා ඒවා ගැන ප්‍රශ්න කිරීමේ දීත් දත්ත කට්ටල සංග්‍රහ කිරීමේ දීත් දත්ත මාධ්‍යවේදයට කාරය භාරයක් ඉටු කළ හැකි අවස්ථාව යි.[6] ස්ත්‍රී-පුරුෂ භාවය අනුව තොරතුරු වෙත පවත්නා ප්‍රවේශයෙහි වෙනස්කම් දැකිය හැකි වීම සහ ස්ත්‍රී-පුරුෂ භාවය අනුව තොරතුරු වර්ග කොට දැක්වීම ද ප්‍රධාන ගැටලු ලෙස පවතී.

සඟවා ඇති තොරතුරු එළිදරව් කර ගැනීම සඳහා තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ නීති යොදා ගැනීමට මාධ්‍යවේදීන් බල ගැන්වෙන කල්හි ඔවුන්ට තිරසර සංවර්ධනයේ තිරසර සංවර්ධන පරමාර්ථ පිළිබඳ සංකල්පයේ කොටසක් ලෙස ආයතනවල වග වීම වැඩි දියුණු කිරීමට තමන්ට තිබෙන හැකියාව වැඩි කර ගත හැකි ය. වාර්තා විවෘත කිරීම සඳහා රාජ්‍යයන් විසින් ගනු ලබන ප්‍රායෝගික පියවරයන්ට ද රාජ්‍ය පරිපාලනය තුළ විනිවිද භාවය සහතික කිරීමට බෙහෙවින් උදව් විය හැකි ය. මේ ආකාරවලින් ගත් විට, තොරතුරු දැන ගැනීමේ නිදහස තිරසර සංවර්ධනය සඳහා අතිමූලික වන විවෘත භාවයේ සංස්කෘතියට ද සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහසට ද සමීපව සම්බන්ධ ය.[7] මාධ්‍ය විවිධත්වය වර්ධනය කිරීම පිණිස සහ මාධ්‍ය භූ දර්ශනය තුළට සුළුතර කණ්ඩායම් ඇතුළත් කරවීම පිණිස මාධ්‍ය තුළ වඩා පුළුල් පරාසයක විහිදුණු සංස්කෘතික ප්‍රකාශනයකට අනුබල දීම සඳහා ද එය වැදගත් වේ. මේ සියලු කරුණු සෑම සැප්තැම්බර් 28 දින ම තොරතුරු වෙත විශ්වීය ප්‍රවේශය සඳහා වූ ජාත්‍යන්තර දිනයක් බවට පත් කිරීමට 2015 නොවැම්බරයේ දී යුනෙස්කෝ සාමාජික රාජ්‍යයන් ඇති කර ගත් එකඟතාවේ වැදගත්කම වැඩි දියුණු කරයි.

**සාවධානව සලකා බැලිය යුතු කරුණු:**

- සංවර්ධන ප්‍රතිපත්තිවල දී හා අයවැය සකස් කිරීමේ දී තිරසර සංවර්ධන පරමාර්ථවල 16 වන පරමාර්ථයේ 10 වන ඉලක්කය - පොදු ප්‍රවේශය සහ මූලික නිදහසවල් - ප්‍රධාන ප්‍රවාහයට එක් කරන්නේ කෙසේ ද?
- ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය කෙරෙහි සංවේදී පොදු තොරතුරු ප්‍රවේශය සඳහා ව්‍යවස්ථානුකූල නීති සහ/හෝ ප්‍රතිපත්තිමය සහතික වීම් සම්මත කිරීමට හා ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයන්ට සහාය විය හැකි වඩාත් ම සාර්ථක ක්‍රමය කුමක් ද?

---

[5] ප්‍රතික්‍රියාවක් ලෙස තොරතුරු නිරාවරණය කිරීම හා ප්‍රායෝගිකව තොරතුරු නිරාවරණය කිරීම අතර වෙනසක් ගෙන හැර පෑ හැකි ය. පළමු වැන්නෙන් ඉල්ලා සිටි විට තොරතුරු නිකුත් කිරීම ගැන කියැවෙන නමුත් දෙවැන්නෙන් රාජ්‍ය බලධාරි ආයතන ස්වයං මුල පිරීමෙන් ලියකියවිලි නිල තත්ත්වයට පත් කර ඇති බැවින් අවශ්‍ය හැම විට ම ලබා ගැනීමේ හැකියාව තිබෙන බව ඇඟවේ. බොහෝ නීති පද්ධතිවල දී මිනුම් දණ්ඩ ලෙස සැලකෙන්නේ පළමු වැන්න වුවත් දෙවැන්න නිශ්චිත සීමාවන් ඇතුළත ඌනපූරක වගන්තියක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.

[6] කරුණාකර http://www.theguardian.com/news/datablog/2012/sep/20/open-data-journalism වෙබ් පිටුවෙහි ඇති "Open Data Journalism" නමැති ලිපිය බලන්න.

[7] මේ කාරණය පිළිබඳ වඩා පුළුල් සාකච්ඡාවක් සඳහා Mariya Riekkinen and Markku Suksi. *Access to Information and Documents as a Human Right*. Abo Akademi University/ Institute for Human rights, Turku/Abo (2015) බලන්න.

- තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ නීතිමය විධිවිධාන පවත්නා රටවල දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා දත්ත මාධ්‍යවේදය ශක්තිමත් කිරීම ඇතුළු ක්‍රම මගින් ප්‍රවේශය හා ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව වැඩි දියුණු කරන්නේ කෙසේ ද?
- පොදු යහපතට අදාළ ඉතා වැදගත් තොරතුරු පෞද්ගලික ක්‍රියාකාරකයන් සන්තකයෙහි පවත්නා විට එම තොරතුරු වෙත ප්‍රවේශ විය හැක්කේ කෙසේ ද? තොරතුරුවල විවෘත භාවය සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කරන ප්‍රතිපත්ති මොනවා ද? සමස්තයක් ලෙස පෞද්ගලික අංශයට ම වඩා විනිවිද භාවයෙන් යුතු තත්ත්වයට පත් විය හැක්කේ කෙසේ ද?
- සංස්කෘතික අදහස් පළ කිරීමේ නිදහස හා විවිධත්වය ප්‍රවර්ධනය කිරීමේ දී ජාතික රාජ්‍ය විකාශන ආයතන හා ස්වාධීන මාධ්‍යය ඉටු කරන ගෝලීය කාර්ය භාරය කුමක් ද?
- "රහසිගත භාවයේ සංස්කෘතියක" සිට විවෘත භාවයේ සංස්කෘතියක් දක්වා මාරු වීමේ කොටසක් ලෙස සංස්කෘතික මට්ටමේ දී පොදු තොරතුරු ප්‍රවේශය ප්‍රවර්ධනය කළ හැක්කේ කෙසේ ද?
- රාජ්‍ය රහසක් සහ පොදුවේ දැන ගත යුතු තොරතුරක් අතර බෙදුම් රේඛාව අඳින්නේ කෙසේ ද?
- අයථා ක්‍රියා රහසේ දැනුම් දීම යනු දැනට නොපවතින හෝ දුර්වල අන්දමින් ක්‍රියාත්මක වන තොරතුරු දැන ගැනීමේ නිදහසක් පිළිබඳ දර්ශකයක් ද? පද්ධති ශක්තිමත් කොට අයථා ක්‍රියා රහසේ දැනුම් දෙන්නන්ට රැකවරණය සැලසිය හැක්කේ කෙසේ ද?

**2) සිදු විය හැකි පමණ ඉක්මවූ වාරණයෙන් හා සමීප නිරීක්ෂණයෙන් මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම**

ඩිජිටල් යුගයේ දී මාධ්‍ය නිදහස මුහුණ පා සිටින්නේ ඔන්ලයින් තොරතුරු වෙත ප්‍රවේශ වීම අත්තනෝමතික ලෙස අවහිර කිරීම, සයිබර් තාක්ෂණය ඔස්සේ කෙරෙන අදහස් පළ කිරීම සීමා කිරීම හෝ ඊට දඬුවම් පැමිණවීම සහ ඩිජිටල් පෞද්ගලිකත්වය අත්තනෝමතික ලෙස ආක්‍රමණය කිරීම පිළිබඳ අභියෝග වර්ධනය වෙමින් පවතින තත්ත්වයකට ය. මෙම වර්ධනයෝ මාධ්‍යවේදයේ යෙදෙන්නන්ට ද ඔන්ලයින් ක්‍රමයට සිය අදහස් පළ කරන අනෙක් අයට ද එපමණක් නො ව බහුවිධ ගලා යාම් හරහා ඔන්ලයින් තොරතුරු වක්‍රව ලබා ගන්නා අයට ද බලපාති. සංස්කෘතික අදහස් පළ කිරීම්වල විවිධත්වය සුරැකීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ ප්‍රඥප්තියෙහි (2005) ගැබ් වන මූලධර්මයක් වුව ද මෙම වර්ධනයෝ සංස්කෘතික අදහස් පළ කිරීමේ විවිධත්වය පවා අයුක්ති සහගත ලෙස සීමා කරති. මෙම සංසිද්ධීහු මහජනයා තොරතුරු වෙත ප්‍රවේශ වීම පමණක් නො ව ඔන්ලයින් තොරතුරුවල හා අදහස් පළ කිරීම්වල පරාසය ද සීමා කරති.

නීත්‍යානුකූලත්වය, අත්‍යවශ්‍යතාව, සමානුපාතිකත්වය හා යුක්ති සහගත අභිමතාර්ථය ඉල්ලා සිටින ජාත්‍යන්තර ප්‍රමිතීන් ඉක්මවා යමින් වෙබ් අඩවි හා සන්නිවේදන මෙවලම් අවහිර කොට අන්තර්ජාල අන්තර්ගතය නියාමනය කරන පියවරයන් සංඛ්‍යාව වැඩි වීම වනාහි බරපතළ ඇඟවීම් ගැබ් කර ගත් තත්ත්වයකි. සියල්ලන් ඇතුළත් කර ගත්, දැනුම් සමාජයන් සඳහා පදනම් දැමීමේ දී යුනෙස්කෝව ප්‍රමුඛතාව දෙන පැතිකඩක් වුව ද මෙම පියවරයෝ සංවර්ධනය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට සමාජයකට තිබෙන හැකියාව සීමා කරති. එම පියවරයන්ගෙන් නියෝජනය වන්නේ යම් ආකාරයක පූර්ව සීමා කිරීමක් හෙවත් අදහස් පළ කළ පසුව අධිකරණයේ දී විභාගයක් කරනු වෙනුවට යම් සන්නිවේදන ක්‍රියාවක් සාපරාධී වරදක් යැයි කල් තියා අනුමාන කිරීමක් ද විය හැකි යි.

මේ හා බැඳි තවත් ගැටලුවක් වන්නේ පමණ ඉක්මවා සමීපව නිරීක්ෂණය කිරීමට තිබෙන ඉඩකඩ නිසා එල්ල වන අභියෝගය යි. අදහස් පළ කිරීමේ නිදහස සඳහා වූ ද මාධ්‍යවේදීන් යොදා ගන්නා රහස්‍ය මූලාශ්‍රයන්ට රැකවරණය සැලසීම සඳහා වූ ද පූර්ව කොන්දේසියක් ලෙස සලකා පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය මැනවින් තහවුරු කොට ඇත. මෙකී පෞද්ගලිකත්වය නිර්නාමිකත්වය සමග ද කේත (codes) භාවිතය සමග ද සම්බන්ධ ය. මෙම පහසුකම් නොපැවතීම නිදහසේ තොරතුරු ගලා යාම කෙරෙහි බරපතළ ලෙස බලපෑ හැකි ය. එය වූකලී ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය අසමානතාවට අභියෝග කිරීමට උත්සාහ කරන පුද්ගලයන්ට මෙන් ම ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පදනම් කර ගෙන වෛරය පැතිරවීම ගැන කෙරෙන අභියෝගාත්මක අභිදේශනාත්මක

අදහස් පළ කිරීම්වලට ද සුවිශේෂ බලපෑම් ඇති කරන්නා වූ තත්ත්වයකි. මාධ්‍යවේදීන් යොදා ගන්නා මූලාශ්‍රයන්ට රැකවරණය සැලසීම දුර්වල වන අවස්ථාවල දී දූෂණය හා බිය ගැන්වීම් වසන් කිරීමත් ප්‍රතිවිපාක අත් වන අයුරින් මූලාශ්‍රයන්හි අනන්‍යතාව අනාවරණය කිරීමත් සිදු විය හැකි ය. මෙය දිගු කාලයේ දී තොරතුරු මූලාශ්‍ර සිඳී යාමට ද සමස්තයක් ලෙස සමාජය ම ස්වයං වාරණයක යෙදී ගැනීමට ද හේතු විය හැකි ය.

මේ සම්බන්ධයෙන් ගත් කල, අදහස් හා මත පළ කිරීමේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සබැඳියාකරු විසින් ද 2015 නිකුත් කළ වාර්තාවක දී[8] මෙම ගැටලුව තක්සේරු කර ඇති බව කිව යුතු ය. සබැඳියාකරු සඳහන් කරන්නේ "රාජ්‍යයන් ෆිල්ටර් කිරීම හා වෙනත් තාක්ෂණයන් යොදා ගෙන නීති විරෝධී වාරණයන් පනවන" තත්ත්වයන්හි දී "කේත යොදා ගැනීම හා නිර්නාමිකත්වය හරහා පුද්ගලයන්ට බාධාවන් මග හැරීම සඳහා සහ බලධාරීන්ගේ කඩා වැදීම්වලින් තොරව තොරතුරු හා අදහස් වෙත ප්‍රවේශ වීම සඳහා බල ගැන්වී ගත හැකි" බව යි. රාජ්‍යයන් විසින් ඔන්ලයින් නිර්නාමිකත්වයට ඉඩ සැලසෙන කේතගත කිරීමේ තාක්ෂණයන් හා මෙවලම් යොදා ගනිමින් සිය ඩිජිටල් සන්නිවේදනයන්හි පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමට පුද්ගලයන්ට නිදහස තිබෙන බව පිළිගන්නා ජාතික නීති සම්මත කළ යුතු යැයි ද වාර්තාව ඉල්ලා සිටී.

පොදු යහපත උදෙසා තොරතුරු වාර්තා කිරීමට නම් මාධ්‍යවේදයේ මූලාශ්‍රයන්හි රහස්‍ය භාවය ආරක්ෂා කරන නීතිමය රාමු අත්‍යවශ්‍ය ය. කෙසේ වුව ද, ඩිජිටල් යුගයේ දී මෙම රාමු සැලකිය යුතු දුබල වීමකට ලක්ව තිබෙන අතර ඒවා සංශෝධනය කිරීමේ හා ශක්තිමත් කිරීමේ - හෝ නොපවතින තැන්වලට ඒවා හඳුන්වා දීමේ - අවශ්‍යතාවක් පවතී. ස්වීඩනයෙන් සැපයෙන අරමුදල්වල සහාය ඇතිව යුනෙස්කෝව මූලාශ්‍ර සුරැකීමේ රාමු වැඩි දියුණු කළ හැකි නිශ්චිත ක්ෂේත්‍රවලට අදාළව සාමාජික රාජ්‍යයන් විසින් සලකා බැලීමට කරුණු 11කින් සමන්විත තක්සේරු මෙවලමක් විමසා බලමින් පර්යේෂණයක නිරත වන ලෙස ලෝක පුවත්පත් සංගමයට (World Association of Newspapers (WAN-IFRA) පවරා ඇත.

**සාවධානව සලකා බැලිය යුතු කරුණු:**

- අවහිර කිරීමේ හෝ ෆිල්ටර් කිරීමේ සහ සමීපව නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවන් අදහස් පළ කිරීම හා සුරක්ෂිතතාව පිළිබඳ නිදහස සඳහා ඇති අයිතියේ යුක්ති සහගත සීමාවන්ට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරන විට සහ නොසපුරන විට වෙන් කොට හඳුනා ගන්නේ කෙසේ ද? උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා පවතින හෝ හඳුන්වා දිය හැකි සුරැකියාවන් කවරේ ද?
- සංස්කෘතික අදහස් පළ කිරීම්වල විවිධත්වයට ඇති වන බලපෑම කුමක් ද, කලාමය අදහස් පළ කිරීම සඳහා වූ නිදහස ආරක්ෂා කළ හැක්කේ සහ එවැනි අදහස් පළ කිරීම්වලට හැකියාව ලැබෙන වාතාවරණය වැඩි දියුණු කළ හැක්කේ කෙසේ ද?
- ඔන්ලයින් වාරණයක් ඇති වුව හොත් නිදහසේ අදහස් පළ කිරීම ආරක්ෂා කිරීම සඳහා සේවා සම්පාදකයන් සහ/හෝ අන්තර්ගතය බෙදා හරින්නන් ඇතුළු අන්තර්ජාල අතරමැදියන් විසින් ඉටු කළ යුතු කාර්ය භාරය කුමක් ද? පෞද්ගලිකව හෝ නියෝජිතයෙකු මාර්ගයෙන් කෙරෙන යම් ආකාරයක වාරණයක් බවට පත් නො වුව හොත් ස්වයං නියාමනය සාර්ථක වේ ද?
- මාධ්‍යවේදීන් සිය මූලාශ්‍රයන් සමග කරන සන්නිවේදනයන් ආරක්ෂා කිරීම සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ගත හැකි පියවරයන් මොනවා ද?

**3) ඔන්ලයින් හා ඕෆ්ලයින් මාධ්‍යවේදයේ සුරක්ෂිතතාව සහතික කිරීම**

මාධ්‍යවේදීන්ට ඔන්ලයින් හා ඕෆ්ලයින් යන දෙයාකාරයෙන් ම සුරක්ෂිතව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හා නිපදවීමේ හැකියාව තිබීම තීරණාත්මක වේ. ඩිජිටල් ආරක්ෂාව ද ඇතුළුව මාධ්‍යවේදීන්ගේ

---

[8] මත හා අදහස් පළ කිරීමේ නිදහස සඳහා ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ සබැඳියාකරු නිකුත් කළ 2015 වාර්තාව A/HRC/29/32.

කායික හා මානසික යහපැවැත්ම සහතික කිරීම මෑත කාලවල දී වඩාත් ම දැවෙන ගැටලුවලින් එකක් බවට පත්ව ඇත. එය වනාහි තාක්ෂණික, ආයතනික, ආර්ථික, දේශපාලනික, නෛතික හා මානසික පැතිකඩවලින් සමන්විත ගැටලුවකි.[9] එය වනාහි නිදහසේ කතා කළ හැකි යැයි මහජනයා තුළ තිබෙන විශ්වාසය කෙරෙහි ද තොරතුරු සඳහා ඇති අයිතිය ප්‍රයෝගිකව භාවිත කිරීම සහ තිරසර සංවර්ධනය කෙරෙහි ද ඇතුළුව මහජනයාට තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා පවතින වාතාවරණය කෙරෙහි ඍජුව බලපාන ගැටලුවකි.

තාක්ෂණයේ දියුණු වීම් සහ පුරවැසි මාධ්‍යවේදය නැගී ඒම අද දින මාධ්‍යවේදය අවබෝධ කර ගත යුත්තේ තත්ත්වයක් නො ව *ක්‍රියාකාරකමක්* අනුව ය යන මතය තහවුරු වීමට හේතු වී ඇත. සෑම බ්ලොග්කරුවෙකු ම ද සමාජ ක්‍රියාකාරකයෙකු ම ද මාධ්‍යවේදී ක්‍රියාකාරකම්වල නිරත නොවන නමුත් එසේ කරන්නන් අඩන්තේට්ටම්වල, තර්ජනය කිරීම්වල හා ප්‍රහාරවල අවදානමට ලක් විය හැකි ය - සාම්ප්‍රදායික මාධ්‍යය තුළ වැඩ කරන මාධ්‍යවේදීන් ද මෙවැනි අවදානම්වලට ගොදුරු විය හැකි ය. මේ අනුව ගත් විට පොදු යහපත උදෙසා වූ මාධ්‍ය අන්තර්ගතය නිපදවන සියල්ලන් ම ආරක්ෂා කළ යුතු අතර විශේෂයෙන් ම ජාත්‍යන්තර ප්‍රජාව එක්සත් ජාතීන් හරහා මෑත දී ඉදිරිපත් කළ යෝජනාවල දී ඒ බව වැඩි වැඩියෙන් පිළිගෙන ඇති තත්ත්වය තුළ එසේ කළ යුතු වේ.

ඝාතනය කිරීම් හා දඬුවම් නොලැබීම අඩු වීමේ කිසිදු ලකුණක් නොපෙනෙන අතර මාධ්‍යවේදීන් ද දඬුවම් නොලැබීම අවසන් කිරීම ද සුරක්ෂිත කිරීම කෙරෙහි ලෝක පරිමාණව වැඩි වැඩියෙන් අවධානය යොමු වෙමින් පවතී. මින් බොහොමයකට මග පෙන්වන්නේ මාධ්‍යවේදීන්ගේ සුරක්ෂිතතාව හා දඬුවම් නොලැබීමේ ගැටලුව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී සැලැස්මේ (UN Plan of Action on the Safety of Journalists and the Issue of Impunity) ගෝලීය රාමුව වන අතර එම රාමුව බහුවිධ පාර්ශ්වකරුවන් විසින් කරනු ලබන සංයුක්ත ක්‍රියාවන් දිරි ගන්වයි. මෙමගින් අත් කර ගත් ජවය කොතරම් ද යන්න එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 68/163 සහ 68/185 යෝජනා (2013) මගින් ද මානව හිමිකම් කවුන්සිලයේ 21/12 (2012) සහ 27/5 (2014) යෝජනා මගින් ද යුනෙස්කෝවේ විධායක මණ්ඩලය සිය 196 වන සැසි වාරයේ දී (2015) මාධ්‍යවේදීන්ගේ සුරක්ෂිතතාව හා දඬුවම් නොලැබීමේ ගැටලුව පිළිබඳව ගත් තීරණය මගින් ද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සන්නද්ධ ගැටුම් තත්ත්වයන්හි දී මාධ්‍යවේදීන් ආරක්ෂා කළ යුතු යැයි ඉල්ලා සිටිමින් ඉදිරිපත් කළ 2222 යෝජනාව (2015) මගින් ද පැහැදිලි වේ. යුනෙස්කෝව, මාධ්‍යවේදීන් ඝාතනය කිරීම වාරණයේ ආන්තික ස්වරූපය ලෙස සලකයි; එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා එවැනි අපරාධ ක්‍රමානුකූලව හෙළා දකින අතර දඬුවම් නොලැබීමේ අවස්ථා වාර්තා කරයි.[10] සංවිධානය මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් දඬුවම් නොලැබීම අවසන් කිරීමේ ජාත්‍යන්තර දිනය වන නොවැම්බර් 2 දා ද ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය වන මැයි 3 දා ද පැවැත්වෙන ගෝලීය සැමරුම්වලට නායකත්වය දෙන අතර දැනුවත්කම ඉහළ නැංවීමට, සන්ධාන ගොඩ නැගීමට, පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමට හා යහපරිචයන් බෙදාහදා ගැනීමට බොහෝ පෙරමුණුවල වැඩ කරමින් සිටී.

අනෙක් අන්තර් රාජ්‍ය සංවිධාන ද වැඩි වැඩියෙන් පියවර ගනිමින් සිටී. යුරෝපා කවුන්සිලය (Council of Europe) මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම හා මාධ්‍යවේදීන්ගේ සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඔන්ලයින් වේදිකාවක් දියත් කර ඇත. මාධ්‍යය හා සිවිල් සමාජ කණ්ඩායම් අනතුරු ඇඟවීම්, පුහුණු කිරීම්, උද්ඝෝෂණය කිරීම් සහ නිදහස් මාධ්‍යවේදීන් උදෙසා ප්‍රතිපත්ති සකස් කිරීම යනාදිය සම්බන්ධ සිය ක්‍රියාකාරකම් වැඩි කරමින් සිටී. කෙසේ වුව ද, ගෝලීය හා ජාතික යන මට්ටම් දෙකේ දී ම දැනුවත්කම තව දුරටත් ඉහළ නැංවිය හැකි ය, දඬුවම් නොලැබීම විසඳිය යුතු දැවැන්ත ගැටලුවක් ලෙස පවතී, මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම සඳහා ආයතන ගොඩ නැගීම සහ ප්‍රහාර එල්ල කළ අපරාධකරුවන්ට දඬුවම් කිරීම සම්බන්ධ දුබලතාවන් කෙරෙහි අවධානය යොමු කිරීමේ

[9] මේ කාරණය සම්බන්ධයෙන්, *Building Digital Safety for Journalism. A Survey of Selected Issues* (2015) නමැති යුනෙස්කෝ ප්‍රකාශනය බලන්න.

[10] මාධ්‍යවේදීන් මුහුණ දෙන වෙනත් අන්තරායන් අතරට නෛතික හා ආර්ථික ස්වරූපයේ අඩන්තේට්ටම් කිරීම්, විදේශ රටවලට පලා යාමට සිද්ධ කිරීම, සිරගත කිරීම හා අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම, ස්වයං වාරණය සහ මෙවලම් හා වාසස්ථාන විනාශ කිරීම හෝ රාජ සන්තක කිරීම ඇතුළත් ය.

අවශ්‍යතාවක් ඇත. මාධ්‍ය නිදහස සුරක්ෂිත ලෙස භාවිතයට ගැනීම හා සම්බන්ධ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය පැතිකඩ කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

**සාවධානව සලකා බැලිය යුතු කරුණු:**

- මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ හා දඬුවම් නොලැබීමට එරෙහිව සටන් කිරීමේ ප්‍රගතිය ශක්තිමත් කිරීම සඳහා අදාළ තිරසර සංවර්ධන පරමාර්ථ දර්ශක යොදා ගැනෙන්නේ ද යන්න නිරීක්ෂණය කළ හැක්කේ හා වාර්තා කළ හැක්කේ කෙසේ ද?
- මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම සඳහා සහ දඬුවම් නොලැබීමට එරෙහිව සටන් කිරීම සඳහා රාජ්‍යයන් විසින් ගත හැකි වඩාත් ම සාර්ථක පියවරයන් මොනවා ද?
- සංවිධාන අතර සහයෝගිතාව (එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතන, ආණ්ඩු, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍යය හා විද්වත් ප්‍රජාව) තව දුරටත් ශක්තිමත් කළ හැක්කේ කෙසේ ද?
- මාධ්‍ය සංවිධානවලට හා මාධ්‍යවේදීන්ට ම මීට වඩා හොඳින් සිය සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා ක්‍රියා කළ හැක්කේ කෙසේ ද?
- මාධ්‍යවේදයේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යන ගමනට එක් වීමට සජීවීකරණය කළ හැකි අමතර ක්‍රියාකාරකයෝ කවරහු ද?
- ඔන්ලයින් සුරක්ෂිතතාව ඇතුළුව මාධ්‍යවේදීන්ගේ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීමට අදාළව ස්ත්‍රී-පුරුෂ සමාජ භාවීය පැතිකඩවල් කෙරෙහි මීට වඩා හොඳින් අවධානය යොමු කිරීම සඳහා ගත යුතු පියවරයන් මොනවා ද?

**නිගමනය**

මාධ්‍ය නිදහස හා තොරතුරු වෙත ප්‍රවේශය වූකලි ප්‍රජාතන්ත්‍රවාදයේ ද තිරසර සංවර්ධනයේ ද අත්‍යවශ්‍ය අංග වන්නේ ය. මාධ්‍යවේදය එම තත්ත්වය ඇති කිරීමට උදව් වෙයි. සමහර විට දේශපාලනික හා සමාජීය ආයතන ගැන විමසිල්ලෙන් සිටින "මුර බල්ලෙකු" ලෙස හැඳින්වෙන නමුත් මාධ්‍යවේදය යනු ඊට වැඩිමනත් දෙයක් ද වේ: එය සමස්ත සමාජයේ ම අදහස් පළ කිරීමේ නිදහස විදහා පායි, එය සංවර්ධන න්‍යාය පත්‍රය හමුවේ නව ප්‍රශ්න මතු කරයි, එය තොරතුරු සම්පාදනය කරමින් පුරවැසියන් බල ගන්වයි. එය සංස්කෘතික අදහස් පළ කිරීම්වල විවිධත්වය තව තවත් වර්ධනය වන වාතාවරණයක් සම්පාදනය කරයි. මේ සියලු හේතු නිසා, මාධ්‍යවේදය උදෙසා පවත්නා තත්ත්වයන් ශක්තිමත් කිරීම වනාහි විවෘත භාවයේ සංස්කෘතිය ද තොරතුරු වෙත ප්‍රවේශය ද මූලික නිදහසවල් ද වර්ධනය කිරීමේ ප්‍රධාන මාර්ගය වන්නේ ය. මෙම පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා 2016 ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දිනය තොරතුරු සඳහා ඇති අයිතිය හා මාධ්‍ය නිදහස ද මාධ්‍යවේදයේ සුරක්ෂිතව නිරත වීම උදෙසා පවත්නා වාතාවරණය වැඩි දියුණු කිරීමට ද උත්සාහ කරයි. එය සමකාලීන ගෝලීය ගැටලු හා අවස්ථාවන් ප්‍රතිරාව නංවයි. මේ ආකාරයෙන් ගත් විට ලොව පුරා පාර්ශ්වකරුවන්ට මෙම දිනය මින් පෙර කිසි දා නොවූ විරූ තරමින් දිස් වන, අදාළ වන හා බලපාන දිනයක් බවට පත් කිරීමට අඛණ්ඩව ක්‍රියා කළ හැකි විය යුතු ය.

**@UNESCO**

***The Original Concept Note here | More information on WPFD2016 on its website here***